2024.03.31 දිනට සමාගමේ රඳවාගත් ඉපැයුම් (රු.'000):

(1) 2 000 (2) 2 300 (3) 2 600 (4) 2 900 (5) 6 200 (......)

23. 2024.03.31 දිනට ව්‍යාපාරයක ක්ෂණික වත්කම් අනුපාතය 1:1 ක් විය. මෙම ව්‍යාපාරය සිය ක්ෂණික වත්කම් අනුපාතය වැඩිදියුණු කිරීමට පහත ක්‍රියාමාර්ග සලකා බලමින් සිටී.

A - රක්ෂණ වාරිකයක් කලින් ගෙවීමට
B - දැනට පවතින තොගය ණයට විකිණීමට
C - අතැති මුදල් භාවිත කරමින් දැනට පවතින කෙටිකාලීන වගකීම් පියවීමට
D - දැනට පවතින තොගය අත්පිට මුදලට විකිණීමට

ඉහත කුමන ක්‍රියාමාර්ගය/ක්‍රියාමාර්ග ව්‍යාපාරයේහි ක්ෂණික වත්කම් අනුපාතය වැඩිදියුණු කිරීමට හේතු වේ ද?

(1) B පමණි. (2) D පමණි. (3) B හා D පමණි.
(4) A, B හා D පමණි. (5) B, C හා D පමණි. (......)

24. පහත සඳහන් කුමන ක්‍රියාකාරකම් ආයතනයක කළමනාකරණ ගිණුම්කරණ කටයුතු ලෙස සැලකිය හැකි ද?

A - භාණ්ඩයක හෝ සේවාවක පිරිවැය නිර්ණය කිරීම
B - ක්‍රියාකාරී මට්ටම වෙනස්වන විට පිරිවැය හැසිරීම විශ්ලේෂණය කිරීම
C - ආයෝජකයන්ට සහ ණය සැපයුම්කරුවන්ට මූල්‍ය තොරතුරු සැපයීම
D - භාණ්ඩයක පිරිවැය-පරිමා-ලාභ සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (......)

25. ආයතනයක තොග කළමනාකරණයට අදාළව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - තොග අයිතමයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ එහි වාර්ෂික ඇණවුම් පිරිවැයෙහි සහ වාර්ෂික රඳවාගැනීමේ පිරිවැයෙහි එකතුව අවම වන පරිදි ඇණවුම් ප්‍රමාණය වේ.
B - තොග අයිතමයක නැවත ඇණවුම් මට්ටම ගණනය කරනු ලබන්නේ එහි උපරිම පරිභෝජනය, උපරිම පොරොත්තු කාලයෙන් ගුණ කිරීමෙන් ය.
C - අනාගත අයිතමයක පිරිවැය මිනුම් කිරීම සඳහා නිශ්චිතව හඳුනාගැනීමේ ක්‍රමය භාවිත කිරීමට නොහැකි විට පිරිවැය සූත්‍ර භාවිත කරනු ලබයි.

(1) B පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

26. 2024.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සමාගමක වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| මූලික වැටුප් | 7 500 |
| දීමනා | 2 500 |

අතිරේක තොරතුරු :

- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවා සහ සේවක දායකත්ව පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ.
- සේවක භාරකාර අරමුදලට (ETF) සේවා දායකත්වය 3% ක් වේ.
- EPF සහ ETF දායකත්වයන් සේවකයන්ගේ දළ වැටුප මත ගණනය කරනු ලබයි.
- යම් මාසයක EPF සහ ETF ඊළඟ මාසයේදී ප්‍රේෂණය කරනු ලබයි.

මෙම සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සේවකයන්ට අදාළව හඳුනාගත් මුළු වියදම සහ 2024.03.31 දිනට ගෙවිය යුතු EPF:

| | සේවකයන්ට අදාළ වියදම (රු.'000) | ගෙවිය යුතු EPF (රු.'000) |
|---|---|---|
| (1) | 10 000 | 1 500 |
| (2) | 10 000 | 2 500 |
| (3) | 11 500 | 2 500 |
| (4) | 11 800 | 1 500 |
| (5) | 11 800 | 2 500 |

(......)

[හත්වැනි පිටුව බලන්න


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- අංක 27 සහ 28 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

සිවිත පෞද්ගලික සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම සමාගමේ අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටම ඒකක 20 000 ක් වේ. ඉදිරි කාලච්ඡේදය සඳහා පහත ඇස්තමේන්තු සකසා ඇත.

| | |
|---|---|
| ඒකකයක් සඳහා සෘජු අමුද්‍රව්‍ය පිරිවැය | කිලෝග්‍රෑමයක් රු. 300 බැගින් කිලෝග්‍රෑම් 2 යි |
| ඒකකයක් සඳහා සෘජු ශ්‍රම පිරිවැය | පැයකට රු. 200 බැගින් පැය 2 යි |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අවශෝෂණ අනුපාතය | සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 300 |
| මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | රු. 8 000 000 |
| මුළු පිරිවැය මත ලාභ අනුපාතය | 25% |

අතිරේක තොරතුරු:

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙන් 50% ක් සහ නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැයෙන් 75% ක් විචල්‍ය පිරිවැය ලෙස ඇස්තමේන්තු කර ඇත.

27. ඉදිරි කාලච්ඡේදය සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය:

| | ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.) | මුළු ස්ථාවර පිරිවැය (රු.'000) |
|---|---|---|
| (1) | 1 000 | 6 000 |
| (2) | 1 600 | 2 000 |
| (3) | 1 600 | 8 000 |
| (4) | 2 000 | 6 000 |
| (5) | 2 000 | 8 000 |

(......)

28. මෙම භාණ්ඩයේ ඒකකයක දායකය :

(1) රු. 500 (2) රු. 600 (3) රු. 900 (4) රු. 1 100 (5) රු. 1 200 (......)

29. නිෂ්පාදන සමාගමක ක්‍රියාකාරී මට්ටම ඒකක 100 000 ක් වේ. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| විකුණුම් | 12 000 |
| මුළු ස්ථාවර පිරිවැය | 3 000 |
| ලාභය | 2 000 |

සමාගමේ ඒකකයක විචල්‍ය පිරිවැය සහ සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක):

| | ඒකකයක විචල්‍ය පිරිවැය (රු.) | සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක) |
|---|---|---|
| (1) | 30 | 100 000 |
| (2) | 50 | 40 000 |
| (3) | 50 | 60 000 |
| (4) | 70 | 40 000 |
| (5) | 70 | 60 000 |

(......)

30. ආයතනයක් විසින් වසර 5 ක ආර්ථික ජීවකාලයක් සහිත යන්ත්‍රයක ආයෝජනය කිරීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. 1 000 000 කි. මෙම ව්‍යාපෘතියෙන් රු. 200 000 ක වාර්ෂික ශුද්ධ මුදල් ගලාඒම් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර, එහි ශුද්ධ වර්තමාන අගය (NPV) සෘණ අගයක් වේ.

මෙම ව්‍යාපෘතියට අදාළව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - මෙම ව්‍යාපෘතියේ මුළු අනාගත ශුද්ධ මුදල් ගලාඒම්වල වර්තමාන අගය එහි ආරම්භක ආයෝජනයට වඩා අඩු වේ.

B - මෙම ව්‍යාපෘතියේ වාර්ෂික ශුද්ධ මුදල් ගලාඒම් රු. 250 000 ක් දක්වා වැඩි වේ නම් එහි පිළිගෙවුම් කාලය වසර 4 ක් වේ.

C - මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ට වඩා වැඩි වන විට එහි ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගනී.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු හිස් ඉරි මත ලියන්න.

31. ආයතනයක ක්‍රියාකාරකම් කිහිපයක් පහත දී ඇත.

A - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම.

B - දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු වගකීම තක්සේරු කිරීම.

C - ගනුදෙනු සටහන් කිරීමට පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංග පැකේජයක් භාවිත කිරීම.

D - වෙළඳපොළ මිල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම.

ඉහත එක් එක් ක්‍රියාකාරකමට බලපාන වඩාත් යෝග්‍ය පරිසර සාධකය පහත දී ඇති අයිතම අතරින් තෝරන්න.

| (1) ආර්ථික | (2) නෛතික | (3) වෘත්තීය | (4) තාක්ෂණික |
|---|---|---|---|

| ක්‍රියාකාරකම | පරිසර සාධකය | ක්‍රියාකාරකම | පරිසර සාධකය |
|---|---|---|---|
| A | .............................. | C | .............................. |
| B | .............................. | D | .............................. |

32. තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | 2024.03.31 දිනට (රු.'000) | 2023.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| මුළු වත්කම් | 800 | 600 |
| මුළු වගකීම් | 450 | 325 |

අතිරේක තොරතුරු:

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ව්‍යාපාරයේ අයිතිකරුට අදාළව පහත ගනුදෙනු දෙක සිදු වී ඇති අතර, ඒවා නිවැරදිව සටහන් කර ඇත.

1. ව්‍යාපාරයේ ණයහිමියෙකුට රු. 50 000 ක් අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික අරමුදල්වලින් ගෙවීම.
2. පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතයට ලබා ගැනීම.

(අ) ව්‍යාපාරයේ වත්කම්, වගකීම් සහ හිමිකමට ඉහත ගනුදෙනු දෙකෙහි සිදු වූ බලපෑම (+ හෝ −) අගය ද සහිතව සඳහන් කරන්න.

| ගනුදෙනුව | වත්කම් (රු.'000) | වගකීම් (රු.'000) | හිමිකම (රු.'000) |
|---|---|---|---|
| 1. | .............................. | .............................. | .............................. |
| 2. | .............................. | .............................. | .............................. |

(ආ) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය (රු.'000) : ..............................

● අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2024.03.31 දිනෙන් අවසන් මාසය තුළදී ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු හතරක් පහත දී ඇත.

A - රු. 2 500 000 ක දැව, කසුන්ගෙන් ණයට මිල දී ගැනීම.

B - රු. 6 000 000 ක දැව සැකසීමේ යන්ත්‍රයක් සීමිත පුබුදු සමාගමෙන් ණයට මිල දී ගැනීම.

C - ලැයිස්තුගත මිල රු. 5 200 000 ක් වූ ලී බඩු රු. 200 000 ක වෙළෙඳ වට්ටමකට යටත්ව අත්පිට මුදලට විකිණීම.

D - රු. 100 000 ක මුදල් වට්ටමකට යටත්ව කසුන්ට ගෙවිය යුතු මුළු මුදල පියවීම.

33. ඉහත එක් එක් ගනුදෙනුව සටහන් කිරීමට භාවිත කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික සටහන් පොත | ගනුදෙනුව | මූලික සටහන් පොත |
|---|---|---|---|
| A | .............................. | C | .............................. |
| B | .............................. | D | .............................. |



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

34. ඉහත 'C' සහ 'D' ගනුදෙනු සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න. (ආඛ්‍යාන අවශ්‍ය නොවේ).

| ගනුදෙනුව | විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| C | | | |
| D | | | |

35. පහත එක් එක් පොදු ලෙජර ගිණුම අයත් වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

| පොදු ලෙජර ගිණුම | ගිණුම් වර්ගය |
|---|---|
| A - ලද වට්ටම් | ............................ |
| B - ගැනිලි | ............................ |
| C - වන්දි සඳහා ප්‍රතිපාදන | ............................ |
| D - යන්ත්‍ර මත සමුච්චිත ක්ෂය | ............................ |

36. වඩාත්ම උචිත ගිණුම්කරණ සංකල්පය භාවිත කරමින් පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A - ............................ සංකල්පයට අනුව ආයතනයක සිදු වන මූල්‍යමය වටිනාකමක් සහිත ගනුදෙනු පමණක් ගිණුම් පොත්වල සටහන් කිරීම අවශ්‍ය වේ.

B - ............................ සංකල්පයට අනුව ඇල්මැති ආර්ථිකවයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන සියලු තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම අවශ්‍ය වේ.

C - ............................ සංකල්පයට අනුව ආයතනයක් ප්‍රවර්තන වර්ෂයේදී මිල දී ගත් නමුත් වර්ෂය අවසානයේදී විකුණා නොමැති භාණ්ඩවල පිරිවැය, විකුණුම් පිරිවැයෙන් බැහැර කෙරේ.

D - ............................ සංකල්පයට අනුව වසරකට වැඩි ඵලදායී ජීවකාලයක් ඇති නමුත් සාපේක්ෂව අඩු වටිනාකමක් සහිත උපකරණවල පිරිවැය ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස සලකනු ලැබේ.

37. ක්‍රීඩා සමාජයක 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයෙහි සිදු වූ පහත එක් එක් ගනුදෙනුව නිසා සමුච්චිත අරමුදලෙහි ශේෂය වැඩි වේ ද අඩු වේ ද යන්න අගය ද සහිතව සඳහන් කරන්න.

| ගනුදෙනුව | බලපෑම වැඩි වේ - (I) / අඩු වේ - (D) | වටිනාකම (රු.'000) |
|---|---|---|
| A - ලැබිය යුතු සාමාජික මුදල් රු. 20 000 ක් ප්‍රවර්තන වර්ෂය තුළදී කපා හැරීම. | ............ | ............ |
| B - වර්ෂය තුළ පැවති ක්‍රිකට් තරගාවලියක් සඳහා ක්‍රීඩා පිටිය රු. 250 000 කට කුලියට දුන් අතර, ඒ සඳහා මුදලින් රු. 200 000 ක් ලැබුණි. | ............ | ............ |



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

38. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ සුදුසු වචන භාවිත කරමින් සම්පූර්ණ කරන්න.

A - හවුල් ව්‍යාපාරයක විධිමත් ගිවිසුමක් නොමැති අවස්ථාවක හවුල්කරුවන්ගේ ............................ සිදුකළ යුතු ය.

B - හවුල්කරුවන් ව්‍යාපාරයට ණය ලබා දෙන විට, 1890 හවුල් ව්‍යාපාර පනත අනුව ............ වාර්ෂිකව අඩුව තිබුණේ නොමැති නම් ණය මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හිමිකම් ලැබේ.

C - ................................................ පනතට අනුව හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව ......... කි/වේ.

39. අමල් සහ නිමල් ලිමිටඩ් සමාගමක් සමානුපාතිකව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2024.04.01 දින චාමර මුදලින් රු. 1 000 000 ක් සහ රු. 2 000 000 ක වටිනා ඉඩමක් ආයෝජනය කරමින් හවුල් ව්‍යාපාරයට බැඳුණි. එදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. නව හවුල් ව්‍යාපාරයද ලාභ සමානුපාතිකව පවත්වාගෙන යනු ලැබේ.

පහත ද සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් දක්වන්න. (ආඛ්‍යාන අවශ්‍ය නොවේ).

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| (අ) චාමර විසින් හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට දායක වීම; | | |
| (ආ) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය: | | |

40. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පමය රාමුව (2018) අනුව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A - හිමිකම යනු ආයතනයේ වත්කම්වලින් සියලු වගකීම් අඩුකළ පසු වත්කම්වලට ඇති ............................ ඇල්ම වේ.

B - වගකීමක් යනු අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ................................ පවරාදීමට ඇති වර්තමාන බැඳීමක් වේ.

C - ආදායම යනු හිමිකම සඳහා සහභාගිවන්නන්ගේ දායකත්වයන් හැරුණු විට, වත්කම්වල ............................ හෝ වගකීම්වල ............................ හේතුවෙන් හිමිකමේ සිදුවන වැඩිවීම වේ.

41. 'LKAS 2 - තොග' ප්‍රමිතියට අනුව පහත එක් එක් ප්‍රකාශය සත්‍ය ද (T) අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|
| A - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග මිනුම් කරනු ලැබේ. | ............... |
| B - ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන්, ඇස්තමේන්තුගත නිමකිරීමේ පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළ පසු ලැබෙන අගයයි. | ............... |
| C - සමාන ස්වභාවයක් සහ භාවිතයක් සහිත සියලුම තොග සඳහා ආයතනයක් විසින් එකම පිරිවැය සූත්‍රය භාවිත කළ යුතු ය. | ............... |
| D - තොග අයිතමයක පිරිවැය මිනුම් කිරීමේදී, පෙර-මිළදී පෙර-නිකුත් ක්‍රමය (FIFO) හෝ බරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය (WAC) යන දෙකෙන් අඩු වටිනාකම ලැබෙන ක්‍රමය භාවිත කළ යුතු ය. | ............... |


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

42. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2024.06.30 දින අධ්‍යක්ෂවරු විසින් අනුමත කරන ලදී. පහත සිදුවීම් 2024.03.31 දිනට පසුව සමාගමේ සිදු විය.

| අංකය | සිදුවීම |
|---|---|
| 1 | රු. මිලියන 1.5 ක වන්දියක් ඉල්ලමින් ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට එරෙහිව 2024.04.10 දින නඩුවක් ගොනු කරන ලදී. අදාළ වන්දිය ගෙවීමට 2024.06.15 දින උසාවිය විසින් නියෝගයක් දෙන ලදී. |
| 2 | 2024.03.31 දිනට ධාරණ වටිනාකම රු. මිලියන 9 ක් වූ කර්මාන්තශාලාවක් 2024.04.20 දින විනාශ විය. |
| 3 | 2024.05.31 දින ගනුදෙනුකරුවෙකු බුන්වත් වූ බව ප්‍රකාශයට පත් කරන ලදී. එම ගනුදෙනුකරුගෙන් 2024.03.31 දිනට ලැබිය යුතු මුදල රු. මිලියන 3 ක් විය. |

ඉහත සිදුවීම් සැලකිල්ලට ගැනීමට පෙර, 2024.03.31 දිනට සමාගමේ මුළු වත්කම් සහ මුළු වගකීම් පිළිවෙළින් රු. මිලියන 60 ක් සහ රු. මිලියන 25 ක් විය.

'LKAS 10 - වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතයට අනුව පහත දෑ හඳුනාගන්න.

(අ) ගැලපෙන සිදුවීම/සිදුවීම් (අංකය/අංක පමණක් දක්වන්න) : ....................

(ආ) ඉහත ගැලපෙන සිදුවීම/සිදුවීම් සැලකිල්ලට ගත් පසු 2024.03.31 දිනට නිවැරදි මුළු වත්කම් සහ මුළු වගකීම්:

මුළු වත්කම් (රු. මිලියන) : ....................      මුළු වගකීම් (රු. මිලියන) : ....................

43. 2021.04.01 දින සීමිත වතු පොදු සමාගම රු. 6 000 000 ක යන්ත්‍රයක් මිල දී ගන්නා ලද අතර, එහි ඵලදායී ජීවකාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. සමාගම විසින් යන්ත්‍ර හීනවන ශේෂ ක්‍රමයට වාර්ෂිකව 40% ක් බැගින් ක්ෂය කරනු ලබයි. 2023.04.01 දින සමාගම විසින් යන්ත්‍රයේ ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයටත් එහි ඇස්තමේන්තු සුන්බුන් අගය ශුන්‍ය ලෙසටත් සංශෝධනය කරන ලදී. 2021.04.01 දින ඇස්තමේන්තු කරන ලද යන්ත්‍රයේ ඵලදායී ජීවකාලයේ වෙනසක් නොවී ය.

'LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ' ප්‍රමිතයට අනුව පහත දෑ සඳහන් කරන්න.

(අ) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම (රු.'000) : ....................

(ආ) 2023.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) : ....................

(ඇ) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම (රු.'000) : ....................

44. 'SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මගින් ඇතිවන ආදායම' ප්‍රමිතයට අනුව පහත එක් එක් ප්‍රකාශය සත්‍ය ද (T) අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|---|
| A- | පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවක් ගනුදෙනුකරුවෙකුට පැවරීමෙන් කාර්ය සාධන බැඳීම ඉටුකළ විට ආයතනය විසින් ආදායම හඳුනාගත යුතු වේ. | .............. |
| B- | ගනුදෙනු මිල යනු භාණ්ඩ හෝ සේවා හුවමාරුවේදී ආයතනයට මුදලින් ලැබෙන ප්‍රතිෆලයේ වටිනාකම ය. | .............. |
| C- | ගිවිසුමක පොරොන්දු වූ ප්‍රතිෆලයක් තුළ ස්ථාවර වටිනාකම්, විචල්‍ය වටිනාකම් හෝ එම දෙවර්ගයම ඇතුළත් විය හැකි ය. | .............. |
| D- | කාර්ය සාධන බැඳීම් එක් නිශ්චිත අවස්ථාවකදී හෝ යම් කාලච්ඡේදයක් තුළදී ඉටුකළ හැකි වේ. | .............. |

45. පහත තොරතුරු 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමර පොදු සමාගමට අදාළ වේ.

| | |
|---|---|
| සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 60 000 |
| කොටසක ඉපැයුම (රු.) | 30 |
| මුළු ලාභාංශ (රු.'000) | 300 |
| ආදායම් බදු වියදම (රු.'000) | 700 |
| පොලී වියදම (රු.'000) | 500 |

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) කොටසක ලාභාංශය (රු.) : ....................

(ආ) බදු පසු ලාභය (රු.'000) : ....................

(ඇ) පොලී ආවරණ අනුපාතය (වාර) : ....................



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

46. පහත පිරිවැය අයිතම ආනයනික උපාංග භාවිත කරමින් බයිසිකල් එකලස් කරන ආයතනයකට අදාළ වේ. මෙම එක් එක් පිරිවැය අයිතමය 'සෘජු හෝ වක්‍ර' සහ 'විචල්‍ය හෝ ස්ථාවර' ලෙස වර්ග කරන්න.

| පිරිවැය අයිතමය | සෘජු (D)/වක්‍ර (I) | විචල්‍ය (V)/ස්ථාවර (F) |
|---|---|---|
| A - ටයර් සහ ටියුබ්වල පිරිවැය | .............................. | .............................. |
| B - එකලස් කිරීමේ සේවකයන්ගේ මාසික වේතන | .............................. | .............................. |
| C - එකලස් අංශයේ සුපරීක්ෂකගේ මාසික වැටුප | .............................. | .............................. |
| D - ග්‍රීස් සහ තෙල් පිරිවැය | .............................. | .............................. |

47. නිෂ්පාදන ව්‍යාපාරයක පිරිවැය හා සම්බන්ධ පහත එක් එක් ප්‍රකාශය සත්‍ය ද (T) අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|
| A - පිරිවැය අයිතමයක් හා සම්බන්ධව නිශ්චිතවම හඳුනාගත හැකි පිරිවැය, පොදුකාර්ය පිරිවැය ලෙස හැඳින්වනු ලබයි. | .............. |
| B - ආයතනයක් විසින් භාවිත කරන අමුද්‍රව්‍ය අයිතමවල ප්‍රමාණය සහ වටිනාකම් යන දෙකම බඩු ලෙජරයේ සටහන් කරනු ලබයි. | .............. |
| C - අදාළ පරාසය තුළ නිෂ්පාදන මට්ටමේ වැඩිවීම හෝ අඩුවීම හේතුවෙන් ස්ථාවර පොදුකාර්ය පිරිවැය වෙනස් නොවේ. | .............. |
| D - යන්ත්‍ර ක්‍රියාකරුවන්ට නිෂ්ක්‍රීය පැය සඳහා ගෙවනු ලබන වේතන, සෘජු ශ්‍රම පිරිවැය ලෙස වර්ග කරනු ලබයි. | .............. |

48. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. එය සතුව නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් ඇත. මෙම පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ අයවැයගත තොරතුරු පහත දී ඇත.

| | පිරිවැය මධ්‍යස්ථාන I | පිරිවැය මධ්‍යස්ථාන II |
|---|---|---|
| ඒකකයක් සඳහා අන්තර්ග්‍රහණය කළ පොදුකාර්ය පිරිවැය | රු. 100 | රු. 240 |
| සැකසීමේ කාලය | සෘජු ශ්‍රම පැය 2 | යන්ත්‍ර පැය 3 |
| සෘජු ශ්‍රම පැය | 50 000 | — |
| යන්ත්‍ර පැය | — | 20 000 |

පිරිවැය මධ්‍යස්ථාන I සහ පිරිවැය මධ්‍යස්ථාන II සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ පදනම් පිළිවෙළින් සෘජු ශ්‍රම පැය සහ යන්ත්‍ර පැය වේ.

එක් එක් නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථානය සඳහා පහත දෑ හඳුනාගන්න.

| | පිරිවැය මධ්‍යස්ථාන I | පිරිවැය මධ්‍යස්ථාන II |
|---|---|---|
| (අ) පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (රු.) | .............................. | .............................. |
| (ආ) මුළු අයවැයගත පොදුකාර්ය පිරිවැය (රු.'000) | .............................. | .............................. |

49. සිමිත ජය පොදු සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. සමාගමේ ඇස්තමේන්තුගත ක්‍රියාකාරී මට්ටම ඒකක 18 000 කි. සමාගමේ අපේක්ෂිත සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකක 10 000 කි. ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල රු. 80 ක් වන අතර දායක විකුණුම් අනුපාතය 25% ක් වේ.

පහත දෑ හඳුනාගන්න.

(අ) ඒකකයක විචල්‍ය පිරිවැය (රු.) : ..............................................

(ආ) මුළු ස්ථාවර පිරිවැය (රු.'000) : ..............................................

(ඇ) ක්‍රියාකාරී මට්ටම ඒකක 18 000 ක් වන විට මුළු පිරිවැය (රු.'000) : ..............................................

(ඈ) ක්‍රියාකාරී මට්ටම ඒකක 15 000 ක් වන්නේ නම් ලාභය (රු.'000) : ..............................................

50. ආයතනයක් විසින් පිරිවැය රු. 5 000 000 ක පරිසර හිතකාමී යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ ඉන්පසු අගය පිළිවෙළින් වසර 10 ක් සහ රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. මෙම යන්ත්‍රයෙන් අපේක්ෂිත වාර්ෂික ශුද්ධ මුදල් ලැබීම රු. 625 000 කි.

මෙම යන්ත්‍රය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) පිළිගෙවීම් කාලය (වසර) : ..............................................

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව) : ..............................................

* * *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

AL/2024/33/S-II

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්:
* පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
* අදාළ අපරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200ක් හිමි වේ.

1. 2024.03.31 දිනට සීමිත සාර්ථ පොදු සමාගමේ සකස් කළ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 80 000 | |
| භාවිත අයිතිය සහිත වත්කම | 10 000 | |
| සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ | | 16 000 |
| - භාවිත අයිතිය සහිත වත්කම | | 500 |
| කල්බදු වගකීම | | 10 000 |
| විකුණුම් | | 98 500 |
| විකුණුම් පිරිවැය | 45 200 | |
| තොග | 5 600 | |
| වෙනත් ආදායම් | | 2 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 3 450 | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | 18 000 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 3 800 | |
| 2023.04.01 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 40 000 |
| 2023.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 33 200 |
| ප්‍රත්‍යාගණන සංචිතය - ගොඩනැගිලි | | 6 000 |
| අතුරු ලාභාංශ | 3 000 | |
| පරිපාලන වියදම් | 25 250 | |
| බෙදාහැරීමේ පිරිවැය | 10 750 | |
| මූල්‍ය පිරිවැය | 400 | |
| වෙනත් වියදම් | 800 | |
| ගෙවූ විශ්‍රාම පාරිතෝෂික වියදම් | 600 | |
| 2023.04.01 දිනට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 900 |
| ගෙවූ ආදායම් බදු | 1 400 | |
| 2023.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 550 |
| | 208 250 | 208 250 |



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**අතිරේක තොරතුරු:**

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) සමාගම විසින් තොග, මුළු පිරිවැය හෝ මුළු ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම් කර ඇත. 2024.03.31 දිනට තොගවල මුළු පිරිවැය සහ මුළු ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙළින් රු. 5 600 000 ක් සහ රු. 6 200 000 ක් විය. කෙසේ වුව ද, 2024.03.31 දිනට එක් තොග අයිතමයක ශුද්ධ උපලබ්ධි අගය එහි පිරිවැයට වඩා රු. 450 000 කින් අඩු විය.

(ii) ශේෂ පිරික්සුමේ වෙළෙඳ ලැබිය යුතු දෑ ශේෂය දක්වා ඇත්තේ 2024.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ ශේෂය වූ රු. 2 550 000 ක් හිලව් කිරීමෙන් පසුව ය.

(iii) ශේෂ පිරික්සුමේ දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ තුළ පිළිවෙළින් මාස තුනක සහ මාස හයක කාලයක් සඳහා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 600 000 ක් සහ රු. 1 500 000 ක් ද ඇතුළත් වේ.

(iv) 2024.03.31 දිනට වගකීම සහතික සඳහා ප්‍රතිපාදන රු. 1 050 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(v) දේපළ, පිරියත සහ උපකරණවල විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2024.03.31 දිනට පිරිවැය/අගය (රු.'000) | 2024.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) | අත්පත් කරගත් දිනට ඇස්තමේන්තු කළ ඵලදායී ජීවකාලය (වර්ෂ) |
|---|---|---|---|
| ගොඩනැගිලි | 48 000 | 4 000 | 20 |
| මෝටර් රථ | 20 000 | 12 000 | 5 |
| කාර්යාල උපකරණ | 12 000 | — | 8 |
| | 80 000 | 16 000 | |

- මෙම සියලු දේපළ, පිරියත සහ උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. මෙම වත්කම්වල ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය, නිවැරදිව ගණනය කර පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත. තවද, වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් හෝ ඉවත් කිරීම් සිදු වී නොමැත.
- 2023.03.31 දින සමාගම විසින් ගොඩනැගිලි ප්‍රථම වරට එහි සාධාරණ අගය වූ රු. 48 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලද අතර එයින් රු. 7 000 000 ක අතිරික්තයක් ඇති වී තිබුණි. මෙම ප්‍රත්‍යාගණනය නිවැරදිව ගිණුම්ගත කර තිබුණි.
- 2024.03.31 දිනට කාර්යාල උපකරණවල පිරිවැය සහ සමුච්චිත ක්ෂය පිළිවෙළින් රු. 16 000 000 ක් සහ රු. 3 000 000 ක් විය. මෙදින සමාගම විසින් කාර්යාල උපකරණ ප්‍රථම වරට එහි සාධාරණ අගය වූ රු. 12 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එමගින් හිඟයක් ඇති විය. මෙම හිඟය ගොඩනැගිලි ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට හර කර ඇත.

(vi) ගොඩනැගිල්ලක භාවිත අයිතිය වර්ෂ 5 ක කාලයක් සඳහා ලබා ගැනීමට 2023.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. මෙදින භාවිත අයිතිය සහිත වත්කමේ පිරිවැය සහ ආරම්භක කල්බදු වගකීම රු. 10 000 000 ක් ලෙස නිවැරදිව ගිණුම්ගත කර තිබුණි. කල්බදු ගිවිසුමට අනුව රු. 3 200 000 ක් බැගින් වූ සමාන වාර්ෂික කල්බදු වාරික 5 ක් 2024.03.31 දිනෙන් ආරම්භ වී කල්බදු කාලසීමාව තුළදී ගෙවිය යුතු වේ. පළමු කල්බදු වාරිකය 2024.03.31 දින ගෙවා ඇති අතර, එය පරිපාලන වියදමක් ලෙස සටහන් කර ඇත. මෙම කල්බදු වාරිකය ගෙවීමට අදාළව වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. 2024.03.31 සහ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 1 800 000 ක් සහ රු. 1 548 000 ක් වේ. කල්බදු කාලසීමාව අවසානයේදී මෙම ගොඩනැගිල්ල කල්බදු ගිණුම්කරුට භාරදිය යුතු වේ. කෙසේ වුව ද, මෙම භාවිත අයිතිය සහිත වත්කම එහි ඵලදායී ජීවකාලය වූ වර්ෂ 20 මත පදනම්ව ක්ෂය කර ඇති අතර එය පරිපාලන වියදම්වල ඇතුළත් කර ඇත.

(vii) ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු සමන්විත වන්නේ පසුගිය වසර සඳහා ගෙවූ රු. 600 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද බදු වලිනි. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 1 100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2023.04.01 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය සමන්විත වන්නේ කොටසක් රු. 10 බැගින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් 4 000 000 කිනි. සමාගම විසින් මෙදිනට පැවති සෑම කොටස් පහකට එක් කොටසක් බැගින් වූ අනුපාතයකට කොටසක් රු. 12 ක ප්‍රතිශතවකට රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීකරණය කරන ලදී. මේ සඳහා කිසිදු ගැළපීමක් ගිණුම්පොත්වල සටහන් කර නොතිබුණි.

[අනෙක් පිටුව බලන්න



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අවශ්‍ය වන්නේ:

'LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සාරංග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළත්):

(1) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
(2) 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(3) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (මුළු ලකුණු 40 යි)

2. (අ) නිෂ්පාදන ආයතනයක් වූ සීමිත අමර පොදු සමාගමට අමුද්‍රව්‍ය අයිතමයකින් වර්ෂයකට ඒකක 10 000 ක් අවශ්‍ය වේ. මෙම අමුද්‍රව්‍ය ඒකකයක ගැනුම් මිල රු. 2 000 කි. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුමක් සඳහා ඇණවුම් පිරිවැය රු. 5 000 කි. මෙම අමුද්‍රව්‍ය ඒකකයක වාර්ෂික තොග රඳවාගැනීමේ පිරිවැය එහි ගැනුම් මිලෙන් 20% ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම සහ අවම තොග මට්ටම පිළිවෙළින් ඒකක 700 ක් සහ ඒකක 200 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ නැවත ඇණවුම් මට්ටම ඒකක 600 ක් වන අතර එහි සාමාන්‍ය ප්‍රතිපූරණ කාලය සති 2 ක් වේ.

අවශ්‍ය වන්නේ:

(1) ප්‍රශස්ත ඇණවුම් ප්‍රමාණය
(2) වර්ෂයක් සඳහා ඇණවුම් ගණන
(3) සාමාන්‍ය තොග මට්ටම
(4) සතියක් සඳහා සාමාන්‍ය ප්‍රතිභෝජනය (ලකුණු 10 යි)

(ආ) සීමිත ජනාරිත් පොදු සමාගම 'A' සහ 'B' යන වර්ග දෙකක භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබයි. මෙම සමාගම 'එකලස්' සහ 'නිමැවුම්' නම් වූ නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් සහ 'ගබඩාව' නම් සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ.

ක්‍රියාකාරී මට්ටම ඒකක 3 000 කට අදාළව සමාගමේ ගිණුම් සහායක විසින් ඉදිරි වර්ෂය සඳහා පහත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කර ඇත. (මෙම ක්‍රියාකාරී මට්ටම සමන්විත වන්නේ 'A' භාණ්ඩයෙන් ඒකක 2 000 කින් හා 'B' භාණ්ඩයෙන් ඒකක 1 000 කිනි).

- එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැයක් සඳහා රු. 20
- නිමැවුම් දෙපාර්තමේන්තුව - සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 30

මෙම පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීමේදී ගිණුම් සහායක විසින් පහත වැරදි සිදු කර ඇති බව පසුව අනාවරණය විය.

- එකලස් දෙපාර්තමේන්තුව සඳහා අයවැයගත යන්ත්‍ර පැය සහ නිමැවුම් දෙපාර්තමේන්තුව සඳහා අයවැයගත සෘජු ශ්‍රම පැය පිළිවෙළින් 65 000 ක් සහ 35 000 ක් ලෙස වැරදි සහගතව යොදාගෙන ඇත.
- රු. 720 000 ක් වන මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර සමානව විභජනය කර ඇත.
- ගබඩාවේ නිවැරදි මුළු පොදුකාර්ය පිරිවැය රු. 210 000 ක් වුව ද එය වැරදීමකින් රු. 150 000 ක් ලෙස ගණනය කර ඇත. එසේ වුව ද, එය නිවැරදි අනුපාතය වූ 2:1 ට පිළිවෙළින් එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර නැවත විභජනය කර ඇත.
- තවද පහත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සැලකිල්ලට ගෙන නොමැත.

| | රු. |
|---|---|
| වක්‍ර වේතන - එකලස් දෙපාර්තමේන්තුව | 340 000 |
| - නිමැවුම් දෙපාර්තමේන්තුව | 80 000 |
| එකලස් දෙපාර්තමේන්තුවේ භාවිත කරන විශේෂිත උපකරණයක කුලිය | 420 000 |
| යන්ත්‍ර සඳහා රක්ෂණ වාරිකය | 170 000 |
| නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා විදුලිය | 100 000 |
| නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා සේවක සුබසාධනය | 400 000 |

අතිරේක තොරතුරු:

- යන්ත්‍ර රක්ෂණ වාරිකය අදාළ වන්නේ එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවලට පමණි. එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල යන්ත්‍ර වටිනාකම් පිළිවෙළින් රු. මිලියන 16 ක් සහ රු. මිලියන 18 ක් වේ.
- එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා අයවැයගත කිලෝවොට් පැය පිළිවෙළින් 8 000 ක් සහ 2 000 ක් වේ.
- එකලස් සහ නිමැවුම් යන නිෂ්පාදන දෙපාර්තමේන්තුවල සේවක සංඛ්‍යාව පිළිවෙළින් 60 ක් සහ 20 ක් වේ.
- නිවැරදි අයවැයගත යන්ත්‍ර පැය සහ අයවැයගත සෘජු ශ්‍රම පැය පිළිවෙළින් 40 000 ක් සහ 20 000 ක් වේ.

/පෙරළිය බලන්න



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- නිෂ්පාදන දෙපාර්තමේන්තුවල සැකසීමේ කාලය පහත පරිදි වේ.

| | A භාණ්ඩය | B භාණ්ඩය |
|---|---|---|
| එකලස් දෙපාර්තමේන්තුව (යන්ත්‍ර පැය) | 2 | 3 |
| නිමැවුම් දෙපාර්තමේන්තුව (සෘජු ශ්‍රම පැය) | 3 | 4 |

- 'A' සහ 'B' භාණ්ඩ ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය පිළිවෙළින් රු. 240 ක් සහ රු. 235 ක් වේ.
- සමාගම විසින් නිෂ්පාදන පිරිවැය මත 40% ක ලාභයක් තබා ගනිමින් භාණ්ඩ විකුණනු ලබයි.

**අවශ්‍ය වන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා සංශෝධිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'A' භාණ්ඩයේ සහ 'B' භාණ්ඩයේ ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය

(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 3 000 දී මුළු නිෂ්පාදන පිරිවැය සහ විකුණුම් වට්නාකම් (ලකුණු 30 යි)

(මුළු ලකුණු 40 යි)

3. (අ) දිල්ශාන් එන්ටර්ප්‍රයිසස් විශේෂිත වර්ගයක පරිගණක විකුණන ආයතනයකි. මෙම ආයතනය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2024.10.01 දිනට පහත ශේෂ ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටා ගෙන ඇත.

| | රු.'000 |
|---|---|
| ගොඩනැඟිලි, පිරියත සහ උපකරණ | 324 |
| තොගය (පරිගණක 2 යි) - පිරිවැයට | 250 |
| වෙළෙඳ ණයගැතියෝ | 126 |
| මුදල් | 120 |
| මුළු වත්කම් | 820 |
| | |
| හිමිකම | 610 |
| වෙළෙඳ ණයහිමියෝ | 150 |
| VAT පාලන - බැර ශේෂය | 60 |
| හිමිකම හා වගකීම් | 820 |

පහත ගනුදෙනු 2024 ඔක්තෝබර් මාසය තුළදී ව්‍යාපාරයේ සිදු වී ඇත.

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 1 | අයිතිකරු විසින් රු. 120 000 ක මුදල් අතිරේක ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ලබාදෙන ලදී. |
| 2 | රු. 20 000 ක වෙනත් ආදායම් ලැබුණි. |
| 3 | ආරම්භක තොගයේ පැවති පරිගණක දෙක, එකක් රු. 295 000 බැගින් (එක් පරිගණයක් සඳහා රු. 45 000 ක VAT ඇතුළත්ව) ණයට විකුණන ලදී. |
| 4 | 10% ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසුව ආරම්භක වෙළෙඳ ණයහිමියන්ට රු. 135 000 ක් ගෙවන ලදී. |
| 5 | එකක් රු. 118 000 බැගින් (එක් පරිගණයක් සඳහා රු. 18 000 ක VAT ඇතුළත්ව) පරිගණක තුනක් ණයට මිල දී ගන්නා ලදී. |
| 6 | තොගයේ තිබූ පිරිවැය රු. 100 000 ක් වූ පරිගණකයක් අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතය සඳහා ලබා ගන්නා ලදී. |
| 7 | තොගයේ තිබූ පිරිවැය රු. 100 000 ක් වූ පරිගණකයක් කාර්යාලයේ භාවිතය සඳහා ලබාදෙන ලදී. |
| 8 | පරිගණකයක් රු. 177 000 කට (රු. 27 000 ක VAT ඇතුළත්ව) අත්පිට මුදලට විකුණන ලදී. මෙම පරිගණකයේ පිරිවැය රු. 100 000 ක් විය. |
| 9 | රු. 80 000 ක මෙහෙයුම් වියදම් ගෙවන ලදී. |
| 10 | රු. 6 000 ක මුදල් වට්ටමක් ලබා දීමෙන් පසුව රු. 120 000 ක් ආරම්භක වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබුණි. |
| 11 | එකක් රු. 147 500 බැගින් (එක් පරිගණයක් සඳහා රු. 22 500 ක VAT ඇතුළත්ව) පරිගණක දෙකක් අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |
| 12 | 2024.10.31 දිනට අවසන් තොගය ශුද්ධ උපලබ්ධි අගය වූ රු. 200 000 ට මනුම් කරන ලදී. තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය අතර වෙනස වියදමක් ලෙස සලකන ලදී. |



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අවශ්‍ය වන්නේ:

(1) 2024.10.01 දිනට ශේෂ සටහන් කර අංක 1 සිට 12 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අංකයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. විකුණුම් හා ගැනුම් දෙකටම අදාළ VAT ගිණුම්කරණ සමීකරණයේ VAT පාලන තීරුවේ සටහන් කළ යුතු වේ. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න).

(රු.'000)

| ශේෂය / ගනුදෙනු අංකය | වත්කම් | | | = | වගකීම් | + | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ණයගැතියෝ | මුදල් | වෙළෙඳ ණයහිමියෝ | VAT පාලන | |
| 2024.10.01 දිනට ශේෂය | | | | | | | |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| — | | | | | | | |
| — | | | | | | | |
| 2024.10.31 දිනට ශේෂය | | | | | | | |

(2) 2024.10.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය ගණනය කිරීම සඳහා ප්‍රකාශනය (ලකුණු 30 යි)

(ආ) 2023.04.01 දිනට සුබසාධක සංගමයක සාමාජිකයන් 200 දෙනෙකු සිටියහ. එක් සාමාජිකයෙකු සඳහා වාර්ෂික සාමාජික මුදල රු. 12 000 ක් වේ. පහත තොරතුරු 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සුබසාධක සංගමයට අදාළ වේ.

යාවජීව සාමාජිකත්වය:

- 2023.04.01 දින සුබසාධක සංගමය විසින් යාවජීව සාමාජික ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. යාවජීව සාමාජික මුදල වර්ෂ 5 ක වාර්ෂික සාමාජික මුදලට සමාන වේ. යාවජීව සාමාජිකත්වය ලබාගත් දිනයේදී මෙම මුදල එකවර ගෙවිය යුතු වේ.
- යාවජීව සාමාජික මුදල්, එය ලද වසරේ සිට වසර 10 ක් පුරා සමානව ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.
- දැනට සිටින සාමාජිකයන් 50 දෙනෙකු සහ නව සාමාජිකයන් 10 දෙනෙකු 2023.04.01 දින නියමිත මුදල ගෙවමින් යාවජීව සාමාජිකත්වය ලබාගන්නා ලදී.

වාර්ෂික සාමාජික මුදල්:

- 2023.04.01 දිනට කලින් ලද සාමාජික මුදල් හෝ හිඟහිටි සාමාජික මුදල් කිසිවක් නොවී ය.
- නව යාවජීව සාමාජිකයන් 10 දෙනා හැර වෙනත් කිසිදු නව සාමාජිකයකු වර්ෂය තුළදී සංගමයට ඇතුළත් නොවී ය.
- සාමාජිකයන් 140 දෙනෙකු ප්‍රවර්තන වර්ෂය සඳහා වාර්ෂික සාමාජික මුදල් ගෙවූ අතර, ඉන් 15 දෙනෙකු ඉදිරි වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවන ලදී.
- ඉතිරි සාමාජිකයන් 10 දෙනා ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවීමට අපොහොසත් විය.

පරිත්‍යාග:

- ක්‍රීඩා මධ්‍යස්ථානයක් තැනීම සඳහා 2023.07.01 දින සුබසාධක සංගමයට රු. 1 000 000 ක පරිත්‍යාගයක් ලැබුණි. මෙම පරිත්‍යාගයෙන්, ක්‍රීඩා මධ්‍යස්ථානය සැලසුම් කිරීමට 2023.10.01 දින රු. 100 000 ක් ගෙවන ලදී. ක්‍රීඩා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2024.01.01 දින ආරම්භ කරන ලද අතර, 2024.03.31 දිනට එදිනට නිම කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට රු. 400 000 ක් ගෙවිය යුතු විය.
- පරිත්‍යාගවලින් වර්ෂයක් තුළදී භාවිත කරන ලද ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.

අවශ්‍ය වන්නේ:

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුබසාධක සංගමයේ පහත ගිණුම්:

(1) යාවජීව සාමාජික අරමුදල් ගිණුම

(2) සාමාජික මුදල් ගිණුම

(3) පරිත්‍යාග අරමුදල් ගිණුම

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 40 යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. (අ) සිමිත අමරත් (පෞද්ගලික) සමාගම අවලෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. එමම සමාගම සියළු ගැනුම් ණය පදනමට පමණක් සිදුකරන අතර, සියළු විකුණුම් ණය පදනමට මෙන්ම අත්පිට මුදලට ද සිදු කරයි. එම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත.

2024.01.01 දිනට පොදු ලෙජරයේ ගිණුම් ශේෂ කිහිපයක් පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| මුදල් ගිණුම | 80 |
| අවලෙඳ ණයගැති පාලන ගිණුම | 295 |
| අවලෙඳ ණයහිමි පාලන ගිණුම | 118 |
| VAT පාලන ගිණුම - බැර ශේෂය | 27 |

පහත ගනුදෙනු 2024 ජනවාරි මාසය තුළදී ව්‍යාපාරයේ සිදු වී ඇත.

(i) මාසය තුළදී විකුණුම් :

| | වටිනාකම (රු.'000) | විකුණුම් තුළ ඇතුළත් VAT (රු.'000) |
|---|---|---|
| ණයට විකුණුම් ; | | |
| - විමල් වෙළෙන්දෝ | 708 | 108 |
| - සුමිත සහෝදර සමාගම | 472 | 72 |
| අත්පිට විකුණුම් | 236 | 36 |

(ii) මාසය තුළදී ගැනුම් :

| | වටිනාකම (රු.'000) | ගැනුම් තුළ ඇතුළත් VAT (රු.'000) |
|---|---|---|
| සිමිත අනන්ත සමාගම | 826 | 126 |
| සමිති වෙළෙන්දෝ | 590 | 90 |

(iii) මාසය තුළදී මුදල් ලැබීම් සහ ගෙවීම් :

| | වටිනාකම (රු.'000) |
|---|---|
| **මුදල් ලැබීම් :** | |
| ආරම්භක අවලෙඳ ණයගැතියන්ගෙන් | 295 |
| විමල් වෙළෙන්දන්ගෙන් (රු. 25 000 ක මුදල් වට්ටමක් ලබා දීමෙන් පසුව) | 683 |
| අත්පිට විකුණුම්වලින් | 236 |
| **මුදල් ගෙවීම් :** | |
| ආරම්භක අවලෙඳ ණයහිමියන්ට | 118 |
| ආරම්භක ගෙවිය යුතු VAT | 27 |
| සිමිත අනන්ත සමාගමට (රු. 30 000 ක මුදල් වට්ටමක් ලබා ගැනීමෙන් පසුව) | 796 |
| මෙහෙයුම් වියදම් | 500 |

අවශ්‍ය වන්නේ:

(1) 2024 ජනවාරි මාසය සඳහා පහත මූලික සටහන් පොත්:

(i) මුදල් ලැබීම් ජර්නලය

(ii) මුදල් ගෙවීම් ජර්නලය

(iii) විකුණුම් ජර්නලය

(iv) ගැනුම් ජර්නලය

(2) ඉහත මූලික සටහන් පොත්වල එකතුව පොදු ලෙජරයට පිවිසීම් කිරීම සඳහා සංලග්නය ද සහිතව ජර්නල් සටහන්

(ලකුණු 20 යි)

/ හත්වැනි පිටුව බලන්න.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) පහත තොරතුරු සීමිත සාර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා; | රු.'000 |
|---|---|
| විකුණුම් | 2 000 |
| විකුණුම් පිරිවැය | 1 200 |
| පොලී වියදම් | 30 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 70 |
| බදු පසු ලාභය | 180 |

| 2024.03.31 දිනට: | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 520 |
| තොගය | 150 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 200 |
| මුදල් හා මුදල් සමාන දෑ | 80 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 300 |
| රඳවාගත් ඉපැයුම් | 200 |
| 12% ණයකර | 250 |
| ජංගම වගකීම් | 200 |

අතිරේක තොරතුරු:

- 2023.04.01 දිනට තොගය රු. 250 000 ක් විය.
- 2023.04.01 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ රු. 300 000 ක් විය.
- සියලු විකුණුම් ණය පදනම මත සිදුකෙරේ.
- වසරක් සඳහා වැඩ කරන දින 360 ක් බව උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ:

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත:

(1) දළ ලාභ අනුපාතය
(2) ශුද්ධ ලාභ අනුපාතය
(3) තොග පිරිවැටුම් අනුපාතය
(4) ක්ෂණික වත්කම් අනුපාතය
(5) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය
(6) ණය එකතු කිරීමේ කාලය
(7) ණය අනුපාතය

(ලකුණු 10 යි)

(ඉ) සමාගමක් විසින් රු. 2 500 000 ක් පිරිවැය වූ යන්ත්‍රයක් මිල දී ගැනීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. යන්ත්‍රය වර්ෂ 5 ක කාලයක් සඳහා භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. 5 වන වර්ෂය අවසානයේදී මෙම යන්ත්‍රයේ අපේක්ෂිත සුන්බුන් අගය රු. 500 000 ක් වේ.

අපේක්ෂිත විකුණුම් (ඒකකවලින්) පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| විකුණුම් (ඒකක) | 7 000 | 8 000 | 9 000 | 6 500 | 4 000 |

ඒකකයක විකුණුම් මිල රු. 500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම විකුණුම් මිල 4 වන සහ 5 වන වර්ෂවලදී පිළිවෙළින් රු. 600 ක් සහ රු. 750 දක්වා වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ. වාර්ෂික හුදු මෙහෙයුම් පිරිවැය විකුණුම් ආදායමෙන් 50% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ක්ෂය ද ඇතුළුව වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 1 100 000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත. සමාගම විසින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

ආයෝජනයේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය (ආසන්න දශම ස්ථාන දෙකකට) | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

අවශ්‍ය වන්නේ:

(1) ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායෑම් එක් එක් මුදල් ප්‍රවාහ අයිතම වෙන වෙනම දක්වමින්
(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)
(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව මෙම ව්‍යාපෘතියෙහි ආයෝජනය කිරීම සඳහා නිර්දේශය (ලකුණු 10 යි)

(මුළු ලකුණු 40 යි)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. (අ) ලාල් සහ පියල් වෙළෙඳ ව්‍යාපාරයක හවුල්කරුවන් වෙති. හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- ලාභාලාභ සම සමව බෙදාගැනීමට හවුල්කරුවන් හිමිකම් ලබති.
- සෑම හවුල්කරුවකුම ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හිමිකම් ලබති.
- සෑම හවුල්කරුවකුම රු. 100 000 ක මාසික වැටුපකට හිමිකම් ලබති.
- හවුල් ව්‍යාපාරයට සපයනු ලබන ණය සඳහා 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබති.

2024.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විකුණුම් | | 15 400 |
| විකුණුම් පිරිවැය | 6 000 | |
| තොගය (භෞතික තොගය මත පදනම්ව) | 700 | |
| පරිපාලන වියදම් | 3 800 | |
| බෙදාහැරීමේ වියදම් | 2 200 | |
| වෙනත් වියදම් | 600 | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 8 000 | |
| මුදල් | 2 500 | |
| ණය - ලාල් | | 1 000 |
| 2023.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| ලාල් | | 4 000 |
| පියල් | | 2 000 |
| 2023.04.01 දිනට ජංගම ගිණුම්: | | |
| ලාල් | | 700 |
| පියල් | | 100 |
| අවිනිශ්චිත ගිණුම | | 600 |
| | 23 800 | 23 800 |

**අතිරේක තොරතුරු:**

(i) හවුල් ව්‍යාපාරයේ කළමනාකරු වන කමල් 2024.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. නව හවුල් ව්‍යාපාරයේ ද ලාභාලාභ සම සමව බෙදාගැනීමට හවුල්කරුවන් එකඟ විය. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කෙසේ වුව ද, කීර්තිනාමය ගිණුම්ගත කර නොමැත.

(ii) කමල්, ඔහුගේ සේවා ගිවිසුමට අනුව රු. 1 000 000 ක වාර්ෂික ප්‍රසාද දීමනාවකට හිමිකම් ලැබී ය. ප්‍රවර්තන වර්ෂය සඳහා මෙම ප්‍රසාද දීමනාව ගෙවා හෝ ගිණුම් පොත්වල සටහන් කර හෝ නොමැත. මෙම ප්‍රසාද මුදල කමල්ගේ ප්‍රාග්ධනය ලෙස සැලකීමට සියලු හවුල්කරුවන් එකඟ විය.

(iii) ප්‍රවර්තන වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත පොලිය වෙනත් වියදම්වලට හර කර අවිනිශ්චිත ගිණුමට බැර කර ඇත.

(iv) වර්ෂය තුළදී ලාල් විසින් මාස හයක වේතන මුදලින් ලබාගෙන ඇත. තවද, පියල් ප්‍රවර්තන වර්ෂය සඳහා සම්පූර්ණ වේතනය සහ 2024 අප්‍රේල් මාසය සඳහා වේතනය ද වර්ෂය තුළදී මුදලින් ලබාගෙන ඇත. හවුල්කරුවන් විසින් මුදලින් ලබාගත් මුළු වේතන පරිපාලන වියදම් තුළ සටහන් කර ඇත.

(v) ලාල් විසින් ලබා දී තිබූ ණය මුදල මත ප්‍රවර්තන වර්ෂය සඳහා පොලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(vi) වර්ෂය තුළදී ලාල් සහ පියල් පිළිවෙළින් පිරිවැය රු. 300 000 ක සහ රු. 200 000 ක භාණ්ඩ ඔවුන්ගේ පෞද්ගලික භාවිතය සඳහා හවුල් ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත. ගිණුම් පොත්වල මේ සම්බන්ධයෙන් ගැළපීමක් සිදුකර නොමැත.

(vii) වර්ෂය තුළදී කමල් විසින් පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ ඔහුගේ පෞද්ගලික භාවිතය සඳහා ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත. කමල් හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා අවස්ථාවේදී ඔහු ලබාගෙන තිබූ භාණ්ඩ හවුල් ව්‍යාපාරය විසින් ඔහුට ලබාදුන් ත්‍යාගයක් ලෙස සැලකීමට අනෙකුත් හවුල්කරුවන් එකඟ විය.

**අවශ්‍ය වන්නේ:**

(1) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද ඇතුළුව)

(2) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් (ලකුණු 30 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) ගාමිණී උපදේශන සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. මෙම ව්‍යාපාරයෙහි සියලුම මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. 2023.12.31 දිනට ව්‍යාපාරයෙහි මුදල් ගිණුමේ හර ශේෂය රු. 35 800 ක් විය. කෙසේ වුව ද, එම දිනට බැංකු ප්‍රකාශනයෙහි පෙන්වූ මුදල් ගිණුම් ශේෂය සමඟ එකඟ නොවී ය. බැංකු ප්‍රකාශනය 2024.01.02 දින ලැබුණි.

පසුව කරන ලද විමර්ශනයේදී පහත හේතු නිසා මෙම වෙනස සිදු වී ඇති බව අනාවරණය විය.

- 2023.12.15 දින රු. 60 000 ක උපදේශන සේවා ආදායමක් සෘජුවම බැංකුවට තැන්පත් කර ඇත.
- 2023.12.20 දින බැංකුව විසින් කාර්යාල ගොඩනැගිලි රක්ෂණය සඳහා රු. 25 000 ක ස්ථාවර නියෝග මත ගෙවීමක් සිදුකර ඇත.
- 2023.12.27 දින ණයහිමියෙකුට ගෙවීම සඳහා නිකුත් කළ රු. 80 000 ක චෙක්පතක් මුදල් ගෙවීමේ ජර්නලයේ දෙවරක් සටහන් කර ඇත.
- 2023.12.28 දින බැංකු ගාස්තු රු. 1 000 ක් බැංකුව විසින් ජංගම ගිණුමට හර කර ඇත.
- 2023.12.29 දින විදුලි ගාස්තු ගෙවීම සඳහා නිකුත් කළ රු. 25 000 ක චෙක්පතක්, අත්සනෙහි වරදක් නිසා බැංකුව විසින් අගරු කර ඇත.
- 2023 දෙසැම්බර් මාසයේදී වෙළෙඳ ණයහිමියෙකුට නිකුත් කළ රු. 50 000 ක චෙක්පතක් 2023.12.31 දින වන විටත් හැරවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.
- වෙළෙඳ ණයගැතියෙකුගෙන් ලද රු. 45 000 ක චෙක්පතක් 2023.12.30 දින බැංකුවේ තැන්පත් කර ඇති නමුත්, එය 2023.12.31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

සෘජු ලැබීම, ස්ථාවර නියෝග මත ගෙවීම් සහ බැංකු ගාස්තු මුදල් ගිණුමෙහි සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව ය. අගරු වූ චෙක්පත සඳහා කිසිදු ගැළපීමක් මුදල් ගිණුමෙහි සිදු කර නොමැත.

අවශ්‍ය වන්නේ:

(1) මුදල් ශේෂය සංශෝධනය කිරීමට අවශ්‍ය ගැළපුම් දක්වමින් 2023.12.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ගිණුම

(2) 2023 දෙසැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 10 යි)

(මුළු ලකුණු 40 යි)

6. (අ) පහත තොරතුරු සීමිත දේශානි පොදු සමාගමේ 2024.03.31 දිනට සහ 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | 2024.03.31 දිනට (රු.'000) | 2023.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 23 500 | 19 750 |
| භාවිත අයිතිය සහිත වත්කම් - ධාරණ වටිනාකම | 12 000 | 7 000 |
| තොග | 7 500 | 5 400 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 6 500 | 3 250 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 500 | 1 100 |
| කල්බදු වගකීම | 8 900 | 5 500 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 3 000 | 4 000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 700 | 550 |
| රඳවාගත් ඉපැයුම් | 7 400 | 6 450 |

අතිරේක තොරතුරු;

(i) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ලාභය සහ බදු පසු ලාභය පිළිවෙළින් රු. 5 500 000 ක් සහ රු. 4 300 000 ක් විය.

(ii) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ හා භාවිත අයිතිය සහිත වත්කම් මත ක්ෂය පිළිවෙළින් රු. 2 800 000 ක් සහ රු. 1 400 000 ක් විය.

(iii) 2023.10.01 දින සමාගම විසින් රු. 800 000 ක ලාභයක් සහිතව මෝටර් රථයක් අත්පිට මුදලට විකුණන ලදී. එදිනට එම මෝටර් රථයෙහි ධාරණ වටිනාකම රු. 2 600 000 ක් විය. තවද, ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් අත්පිට මුදලට යන්ත්‍රයක් මිලදී ගෙන ඇත.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iv) සමාගම විසින් මෝටර් රථයක භාවිත අයිතිය ලබාගැනීම සඳහා 2023.04.01 දින නව කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. ඒ සඳහා මූලික ගෙවීමක් ද මෙදින සිදුකර ඇති අතර මෙදිනට කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 5 400 000 ක් විය.

(v) රු. 900 000 ක කල්බදු පොලිය ද ඇතුළත්ව කල්බදු වාරික 2024.03.31 දින ගෙවා ඇත.

(vi) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් සිදුකර ඇති කොටස් නිකුත් කිරීම් පහත පරිදි වේ.

- රු. 8 500 000 ක මුදල් ප්‍රතිෂ්ඨාවකට හිමිකම් කොටස් නිකුතුවක්
- රු. 2 500 000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීකරණය කරමින් කොටස් නිකුත් කිරීම

(vii) ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් අතුරු ලාභාංශයක් ද ගෙවා ඇත.

**අවශ්‍ය වන්නේ:**

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය' ප්‍රමිතයට අනුව 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජිනිත ලංකා පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය (*මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහ සොයාගැනීමේදී වක්‍ර ක්‍රමය භාවිත කරන්න*). (ලකුණු 20 යි)

(ආ) පෙර පාසලක කළමනාකාරිත්වය විසින් 2025 ජනවාරි මාසයේදී ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමට සැලසුම් කරයි. පෙර පාසලෙහි සිසුන් ගණන 70 ක් වේ. මෙම ක්‍රීඩා උත්සවයේ ඇස්තමේන්තු කරන ලද පිරිවැය පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| සිසුවකු සඳහා ක්‍රීඩා නිල ඇඳුමක පිරිවැය | 6 000 |
| සිසුවකු සඳහා ආහාර පාර්සලයක පිරිවැය | 400 |
| සිසුවකු සඳහා සහභාගිත්ව සහතික පත්‍රයක මුද්‍රණ පිරිවැය | 100 |
| ක්‍රීඩා ඉසව් සඳහා භාණ්ඩ පිරිවැය | 30 000 |
| පුටු කුලියට ගැනීමේ සහ සැරසිලි පිරිවැය | 40 000 |
| ක්‍රීඩා පිටිය සැකසීමේ පිරිවැය | 25 000 |
| ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට ගැනීමේ පිරිවැය | 10 000 |
| අමුත්තන් සඳහා ආහාර පිරිවැය | 55 000 |

**අතිරේක තොරතුරු:**

පහත ප්‍රභවයන්ගෙන් ක්‍රීඩා උත්සවයේ පිරිවැය ආවරණය කරගැනීමට අපේක්ෂා කෙරේ.

- මෙම පෙර පාසලෙහි ආදි සිසුන්, ක්‍රීඩා උත්සවය සඳහා සහභාගී වන සෑම සිසුවකුගේම ක්‍රීඩා නිල ඇඳුම සඳහා රු. 2 000 බැගින් පරිත්‍යාග කිරීමට එකඟ වී ඇත.
- ක්‍රීඩා උත්සවයේ ශබ්ද විකාශන යන්ත්‍රයේ සම්පූර්ණ කුලිය සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමට පෙර පාසලෙහි කළමනාකරණ මණ්ඩලයේ සභාපතිතුමා එකඟ විය.
- ඉතිරි මුදල ආවරණය කරගැනීම සඳහා සහභාගිවන සෑම සිසුවකුගෙන්ම ගාස්තුවක් අය කෙරේ.

**අවශ්‍ය වන්නේ:**

පෙර පාසල විසින් දැරිය යුතු පිරිවැය අයිතම හැසිරීමට අනුව පහත සඳහන් දෑ ගණනය කරන්න.

(1) ක්‍රීඩා උත්සවයේ මුළු ස්ථාවර පිරිවැය

(2) සිසුවකු සඳහා විචල්‍ය පිරිවැය

(3) එක් සිසුවකුගෙන් රු. 7 500 ක ගාස්තුවක් අය කරයි නම්, මුළු පිරිවැය ආවරණය කිරීමට ක්‍රීඩා උත්සවය සඳහා සහභාගී විය යුතු සිසුන් සංඛ්‍යාව

(4) ක්‍රීඩා උත්සවය සඳහා පෙර පාසලේ සියලුම සිසුන් සහභාගිවන්නේ නම් සහ එක් සිසුවකුගෙන් රු. 7 500 ක ගාස්තුවක් අය කරයි නම් අපේක්ෂිත අතිරික්තය

(5) එක් සිසුවකුගෙන් රු. 9 500 ක් අය කරයි නම් සහ ක්‍රීඩා උත්සවය සඳහා සිසුන් 55 දෙනෙකු සහභාගී වන්නේ නම්, ආරක්ෂිත ආන්තිකය (සිසු සංඛ්‍යාවෙන්)

(6) ස්ථාවර පිරිවැයෙන් කොටසක් ආවරණය කිරීම සඳහා රු. 45 000 ක පරිත්‍යාගයක් ලැබෙයි නම් සහ ක්‍රීඩා උත්සවය සඳහා සිසුන් 60 දෙනෙකු සහභාගී වන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා එක් සිසුවකුගෙන් අය කළ යුතු ගාස්තුව (ලකුණු 20 යි)

(මුළු ලකුණු 40 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/